මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ පෞද්ගලික සමාගම - 2018

------------------------------------------------------------------

**1.1 මතය**

මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ පෞද්ගලික සමාගමේ (“සමාගම”) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ දැක්වීම** | **අදහස් නිර්දේශය** |
|---|---|---|
| අ) ශ්‍රී.ගි.ප්‍ර.අ. 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, පරිච්ඡේද අංක 27 ට අනුව ආයතනයක් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුත්තේ මුදල් පදනම මත නොව උපචිත පදනම මතයි. කෙසේවුවත් 2018 ඔක්තෝම්බර් 01 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු. 1,000,000 ක ස්ථාවර තැම්පතුවක් සඳහා ලැබිය යුතු රු. 28,125 ක පොලී ආදායම මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සහ ලාභ අලාභ ගිණුමේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කර නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී ඇත. | එකඟ වන අතර ඊළඟ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කරනු ලැබේ. | ප්‍රමිතයේ නියමයන්ට අනුකූලව කටයුතු කල යුතුය. |
| ආ) රු. 487,827 ක වැඩිපුර ගෙවන ලද ආදායම් බදු මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් වලට හිලව් කර ඇති හෙයින් සමාගම ශ්‍රී.ගි.ප්‍ර.අ. 01 ට අනුකූල නොවී කටයුතු කර ඇත. | එකඟ වන අතර ඊළඟ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කරනු ලැබේ. | ප්‍රමිතයේ නියමයන්ට අනුකූලව කටයුතු කල යුතුය. |
| ඇ) ශ්‍රී.ගි.ප්‍ර.අ. 01 හි පරිච්ඡේද අංක 60 ට අනුව ආයතනයක් වත්කම් හා වගකීම් ද්‍රවශීලතා අනුපිළිවෙලට ඉදිරිපත් කල යුතුය. එසේ වුවත් සමාගම ජංගම වත්කම් වලට පසුව ජංගම නොවන වත්කම් ඉදිරිපත් කර ඇත. | එකඟ වන අතර ඊළඟ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කරනු ලැබේ. | ප්‍රමිතයේ නියමයන්ට අනුකූලව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධායක නිලධාරීන් සඳහා වූ රු. 50,369 ක දේපල ණය ප්‍රතිපූර්ණය කිරීමක් දිරි දීමනා ගෙවීමේ ගිණුමට ඇතුලත් කර ඇත. | එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශන වල සහ ලෙජර් ගිණුම් වල අදාල ගිණුම යටතේ දැක්විය යුතුය. |

## 1.6 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම 2017 අංක 07 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත ( වගන්ති අංක - 02 උප වගන්ති 02 (C) ) අනුකූලව 2018 දෙසැම්බර් මාසය සඳහා ආර්ථික සේවා ගාස්තු ගෙවා නොමැත. රු. 20,480,605 ක පිරිවැටුමට අදාල රු. 102,403 ක ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුවක් ගිණුම් ගත කර නොමැත. | එකඟ වේ. නමුත් ආදායම් බදු අවසන් කරන විට ආර්ථික සේවා ගාස්තු හිලව් කරනු ලැබේ. | පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සහ ඊට අනුරූප වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය ලෙස ලාභයක් හෝ පාඩුවක් වාර්තා වී නොමැත. ඊට හේතුව වන්නේ සමාගම සියළුම මෙහෙයුම් වියදම් මව් සමාගමෙන් ප්‍රතිපූර්ණය කිරීමයි. එම නිසා ලාභයක් හෝ අලාභයක් මූල්‍ය වර්ෂය අවසන් වන විට උපයා නොමැත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ බඳවා ගැනීම්, ප්‍රතිපත්තියක් වශයෙන් ප්‍රසිද්ධ බඳවා ගැනීමේ ආයතනයක් හරහා සිදු කරයි.<br>මෙම සේවාව සඳහා එම සමාගම සමඟ වූ ගිවිසුම 2018 ඔක්තෝම්බර් 25 දින කල්පිරී ඇත. අලුත් බඳවා | සඳහන් කර ගන්නා ලදී. | අලුත් බඳවා ගැනීමේ ආයතනයක් තෝරා ගැනීමට හෝ පෙර ආයතනය සමඟ පවත්නා ගිවිසුම දීර්ඝ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

ගැනීමේ ආයතනයක් තෝරා ගැනීමට හෝ එම ආයතනය සමඟ පවතින ගිවිසුම දීර්ඝ කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

### 3.2 මව් සමාගමේ සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවකයන් දෙදෙනෙකු සහ කළමණාකරන පුද්ගලයන්ගේ සේවය කිසිදු වැටුපක් හෝ පාරිතෝෂිතයක් ගෙවීමකින් තොරව සමාගම ලබා ගෙන තිබේ. ඊට අමතරව මව් සමාගමේ කාර්යාල පරිශ්‍රය, කාර්යාල උපකරණ, ලිපි ද්‍රව්‍ය සහ විදුලිය ද භාවිතා කර තිබේ. | මෙය ඊළඟ අධ්‍යක්ෂ මණ්ඩලයේදී සාකච්ඡා කරනු ලැබේ. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කරයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම සඳහා වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වාගෙන නොයන අතර සමාගමේ අභ්‍යන්තර විගණනය මව් සමාගම විසින් ද ආවරණය නොකරයි. ඒ හෙයින් සමාගම 2018 අංක 19 දරණ ජාතික විගණන පනතට අනුකූල වී නොමැත. | අප අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කර සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන්නෙමු. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතට අනුකූලව කටයුතු කල යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම සඳහා වෙනම විගණන කමිටුවක් නොමැති අතර සමාගමේ මෙහෙයුම් කටයුතු මව් සමාගමේ විගණන කමිටු රැස්වීම් වලින් සමාලෝචනය කර නොමැත. | අප අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කර සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන්නෙමු. | සමාගම වෙනම විගණන කමිටුවක් තබා ගත යුතු හෝ මව් සමාගමේ විගණන කමිටු රැස්වීම් වල වෙනම න්‍යාය පත්‍රයක් යටතේ සමාලෝචනය කල යුතුය. |